**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - 2021**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මතය

**------**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **<u>2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත</u>** | | | |
| (i) | 3 (අ) උපවගන්තිය | සේවකයන් සංවර්ධන ක්‍රියාවලියෙහි ක්‍රියාකාරී කොටස්කරුවන් කර ගැනීම සඳහා ඔවුන්ගේ සුබසාධනය සහතික කරණු පිණිස ගනු ලැබූ විධිමත් පියවරයන් නිරීක්ෂණය නොවීය. | සේවකයන් සංවර්ධන ක්‍රියාවලියේ ක්‍රියාකාරී කොටස්කරුවන් කර ගැනීම සඳහා කම්කරු නීතිය, කාර්මික සබඳතා, මානව සම්පත් සංවර්ධනය, ප්‍රසම්පාදනය, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ අවබෝධය ලබා දීම තුළින් තම රාජකාරී කටයුතුවලට සෘජුව සම්බන්ධවන විෂයන් පිළිබඳව ධාරිතා වර්ධනය කිරීමේ අරමුණින් කෙටි කාලීන හා දීර්ඝ කාලීන පාඨමාලා පවත්වනු ලැබූ අතර සංවර්ධන ක්‍රියාවලිය | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා දිය හැකි ආකාරය පිළිබඳව දැනුවත් කර ඇති අතර කම්කරු නීතිය හා කාර්මික සබඳතා පිළිබඳව සේවා හා සේවක දෙපාර්ශවයේම දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහාද කටයුතු කර ඇත. | |
| (ii) | 3 (ඇ) උපවගන්තිය | ආයතනය විසින් 2021 වර්ෂය තුල ශ්‍රම අධ්‍යයනයට අදාල සමීක්ෂණ පවත්වා නොතිබුණි. | කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන අභිවර්ධන ආයතනය සමඟ කටයුතු කරමින් පවතින අතර කම්කරු නීතිය හා කාර්මික සබඳතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හා කම්කරු නීතිය හා කාර්මික සබඳතා පිළිබඳ උසස් ජාතික සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන් විසින් පරීක්ෂණ පත්‍රිකා සකස් කර ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී මෙම පර්යේෂණ කටයුතු පුළුල් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iii) | 3 (ඇ) උපවගන්තිය | පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම ආයතනයේ එක් ප්‍රධාන අරමුණක් වුවත් 2021 මාර්තු 31 දින දක්වා එවැනි පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවාවක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2007 වර්ෂයේ සිට 2019 නොවැම්බර් දක්වා කාලය තුල පුස්තකාලයක් ස්ථාපනය කර තිබූ අතර නාරාහේන්පිට කම්කරු මහලේකම් කාර්යාල පරිශ්‍රයේ කාර්යාලය ස්ථාපනය කර නවීකරණ කිරීමෙන් පසුව 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට පුස්තකාලය ස්ථාපනය කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. මාර්ග ගත ක්‍රමයෙන් පිවිසිය හැකි ඉලෙක්ට්‍රොනික පුස්තකාලයක් නිර්මාණය කිරීමට කටයුතු ආරම්භ කර ඇත. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iv) | 3 (ඉ) උපවගන්තිය | සමාන අරමුණු සහිත ජාතික හා විදේශීය ආයතන සංවිධාන සංගම් සහ සමිති සමඟ සමීප සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සිදු කලයුතු වුවද එවැනි වැඩසටහන් විධිමත් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉන්දියාවේ වී.වී.ගිරි ජාතික කම්කරු ආයතනය සමඟ පැවති අවබෝධතා ගිවිසුම යාවත්කාලීන කිරීම සඳහා සාකච්ඡා කර ඇති අතර ඉදිරියේදී නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිරීක්ෂණ ලබා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කර ගිවිසුමට එළඹීමට කටයුතු කරනු ඇත. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුබද්ධ ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවයකට එළඹීමට අවශ්‍ය සාකච්ඡා වාර 03ක් දැනටමත් පවත්වා ඇති අතර දැනට පවත්වාගෙන යන කම්කරු නීති හා කාර්මික සබඳතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා එම ආයතනයේ සම්පත් දායකත්වය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සාකච්ඡා පවත්වා අවසන් කර ඇත. | |
| (v) | 3 (ඊ) උපවගන්තිය | ආයතනය විසින් සහය ලබාගන්නා විශ්ව විද්‍යාල හා ඒ සමාන ආයතන සමඟ සාකච්ඡා සිදුකර තිබුණද (තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හැර) පාඨමාලා පැවැත්වීම සහ සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය කර නොතිබුණි. | මිනිස් බල රැකියා නියෝජිත ආයතන හා රැකියා නියුක්තිකයන් හා සම්බන්ධ නීති රෙගුලාසි පිළිබඳ අධ්‍යයනය හා ඒවායේ පවත්නා හිඩැස් හඳුනා ගැනීම හා එහි සංවර්ධනය උදෙසා පවතින අවස්ථා හඳුනා ගැනීම අරමුණු කර ගනිමින් කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය සමඟ පර්යේෂණයක් සඳහා මූලික සාකච්ඡා පවත්වා ඇත.<br>ශ්‍රී ලංකා ඇගයීම් සංගමය සමඟ අධීක්ෂණය හා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ඇරඹීමට ඇති ශක්‍යතාව පරීක්ෂා කර බැලීමේ අරමුණින් මූලික සාකච්ඡා පවත්වා ඇති අතර රාජ්‍ය නිලධාරීන්ගේ දෙමළ භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීම සඳහා වූ සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා ඇත.<br>ජාතික වෘත්තීය සුදුසුකම ලබා ගැනීම සඳහා (NVQ) අයදුම් කිරීම පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (vi) | 4 (උ) උපවගන්තිය | ආයතනයේ අරමුණුවලට සම්පූර්ණයෙන් හෝ අර්ධ | ඉන්දියාවේ විවිගිරි ජාතික කම්කරු ආයතනය සමඟ පැවති | පනතේ සඳහන් අරමුණු ඉටුකර |

| | | | | |
|---|---|---|---|---|
| | | වශයෙන් සමාන අරමුණු සහිත, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පිහිටි වෙනත් ආයතන සමඟ පුද්ගලයන් හුවමාරු කර ගැනීම හා පුහුණු කිරීම, පර්යේෂණ හා උපදේශක සේවා පිළිබඳ සහ සාමාන්‍යයෙන් ඔවුනොවුන්ගේ පොදු අරමුණු ඉදිරියට ගෙන යාම පිණිස විය හැකි යම් කාර්ය සඳහා ගිවිසුම්වලට ඇතුලත් වීම සිදුකල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | අවබෝධතා ගිවිසුම යාවත්කාලීන කිරීම සඳහා සාකච්ඡා කර ඇති අතර ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගිවිසුමට එළඹීමට කටයුතු කරනු ඇත. | ගැනීමට කටයුතු කල යුතුය. |
| (vii) | 16 (1) උපවගන්තිය | මේ පනත යටතේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය තාක්ෂණික කමිටු යම් සංඛ්‍යාවක් මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි වුවද ඊට අනකූලව එවැනි කමිටු පත්කර නොතිබුණි. | පනතේ ඉදිරි අනාගත අවස්ථා හා ආයතනයේ ඉදිරි පුළුල් වීමත් සමඟ සිදු කළ යුතු කරුණු සම්බන්ධයෙන් මෙවන් ප්‍රතිපාදන සලසා දී තිබුණ ද මේ දක්වා එවැන් අවශ්‍යතාවයක් පැන නොනැගී ඇති බැවින් මණ්ඩලය විසින් තාක්ෂණික කමිටු පත් කර නොමැත. ඉදිරි කාලයේ දී ආයතනයේ කටයුතු පුළුල් කිරීමට තරම් වූ මූල්‍ය හැකියාවක් ලද විට හා අවශ්‍යතාවය මත පාලක මණ්ඩලය විසින් ලබා දෙන උපදෙස් මත පනතේ මෙම වගන්ති ප්‍රකාරව තාක්ෂණික කමිටු පත් කිරීම ඉදිරියේ දී සිදු කරනු ඇත. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 13,109,428 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 7,426,319 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,535,747 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ආයතනය පාඨමාලා සහ වැඩසටහන් පැවැත්වීම මාර්ගගත ක්‍රමය මගින් පැවැත්වූ බැවින් 2020 වර්ෂයේ උපයන ලද රු.15,932,955 ක් වූ ආදායම් සමාලෝචිත වර්ෂයේදී රු.28,364,579 ක් දක්වා වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ප්‍රධාන ආදායම්/ වියදම් අයිතමය | 2021 (රු.) | 2020 (රු.) | වෙනස (රු.) | වෙනසේ ප්‍රතිශතය සියයට (%) |
|---|---|---|---|---|
| ආදායම | 28,364,579 | 15,932,955 | 12,431,624 | 78.02 |
| රාජ්‍ය ප්‍රදාන | 10,000,000 | 6,100,000 | 3,900,000 | 63.93 |
| වැඩසටහන් පැවැත්වීම | 4,186,055 | 3,173,959 | 1,012,096 | 31.89 |
| අනිකුත් මෙහෙයුම් වියදම් | 21,069,096 | 26,285,315 | (5,216,219) | (19.84) |

පූර්ව වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා රාජ්‍ය ප්‍රදාන ලැබීම් සියයට 74 ක හා ප්‍රාග්ධන වියදම් සියයට 32 ක වර්ධනයක් පවතින බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2001 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අධ්‍යාපන අංශය වෙත පරිත්‍යාග කොට තිබූ වෑන් රථයක් 2008 වර්ෂයේදී සේවක අධ්‍යාපන අංශය කම්කරු දෙපාර්තමේන්තුවෙන් වෙන්ව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ලෙස ස්ථාපිත කරන විට ආයතනය භාරදී තිබුණද මෙම වාහනය ආයතනය වෙත විධිමත්ව පවරාගෙන නොතිබුණි. වාහනයෙහි කාර්මික දෝෂයක් හේතුවෙන් ධාවනයෙන් ඉවත්කර තිබූ නමුත් මෙම වාහනයේ ලියාපදිංචි අංකයට සමාන ලියාපදිංචි අංකයක් සහිතව පෞද්ගලික හිමිකරුවෙකු සතුව වෑන් රථයක් පවතින බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර තිබුණි. මේ අනුව ආයතනය විසින් කොළඹ වංචා විමර්ශන කාර්යාංශය වෙත 2020 ජනවාරි 05 දින පැමිණිලි කර තිබූ අතර එම කාර්යාංශය විසින් අධිකරණ නියෝගයක් මගින් එම වාහනයට අදාල මුල් ගොනුව හා පැවරුම් ගොනුව කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට දන්වා තිබුණද 2021 | කොළඹ වංචා විමර්ෂණ අංශයට වාර්තා කිරීමෙන් පසු එහි මුල් ගොනුව හා පැවරීම් ගොනුව ලබා දෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත දන්වා නැවතත් ඉල්ලීම් කළ ද මේ වන තෙක් එය යොමු කර නොමැත. තවදුරටත් ඔවුන් වෙතින් විමසීම් කර ඒ පිළිබඳ තොරතුරු වාර්තා කරමි.<br>2021 දෙසැම්බර් 17 දින ආයතනය වෙත ලැබී ඇති වංචා විමර්ෂණ අංශයේ 2021 දෙසැම්බර් 04 දිනැති ලිපිය පරිදි මේ සම්බන්ධයෙන් මුල් ගොනුව හා පැවරුම් ගොනුව ලබා ගැනීමට අධිකරණ නියෝග මෝටර් රථ දෙපාර්තමේන්තුවට භාර දී ඇති බව දන්වා එවා ඇත. මෙම විමර්ෂණයේ ප්‍රගතිය ඉදිරියේ දී දැනුම් දෙන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | මෙම විමර්ශන කඩිනම් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනටත් එම ගොනු ලබානොදීම හේතුවෙන් පරීක්ෂණ කටයුතු නැවතී තිබුණි. | | |
| (ආ) | ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 45 දෙනෙකු වන අතර 2021 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 14 ක් එනම්, අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 31 ක් විය. ඒ අනුව, සියයට 69 ක කාර්ය මණ්ඩල ඌනතාවයක් සහිතව ආයතනය පවත්වාගෙන යන අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 න් 06 ක් ම පුරප්පාඩුව පැවතුණි. අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ස්ථිර නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි. පාලන අංශයේ කාර්ය මණ්ඩල තොරතුරු අනුව, 2017 දී කළමණාකරණ සහකාර තනතුරු 04 ක් පැවති අතර එය 2022 වන විට 01 තනතුරක් දක්වා අඩුවී තිබුණි. විභාග අංශයේ වැඩසටහන් නිලධාරී සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා නිලධාරීන් බඳවා නොගැනීමෙන් විධිමත් පරිදි රාජකාරි ඉටු නොවන බව නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගතය හේතුවෙන් ආයතනයේ මූල්‍ය තත්වය අභියෝගයකට ලක් වූ බැවින් සියළුම අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අනර්ථකාරී වියදම් දැරීමක් බැවින් බඳවා ගැනීම් කිරීම නිසි ඇගයීමකට අනුව අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පමණක් පිරවීම පිළිබඳ ඇගයීමක් කරන ලදී. එහි දී සනාථ වූයේ සියළු තනතුරු සඳහා බඳවා ගතහොත් රජයට අනවශ්‍ය වැය බරක් දැරීමට සිදු වන බවයි.<br>ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලයෙන් සහකාර අධ්‍යක්ෂ (පාලන, පර්යේෂණ) තනතුරු 02ක් ද වැඩසටහන් නිලධාරී තනතුරු 01ක් ද මූල්‍ය නිලධාරී තනතුරු 01ක් සහ කළමණාකරණ සහකාර තනතුරු 01ක් බඳවා ගැනීම සඳහා මේ වන විට ඉල්ලුම්පත් කැඳවා ඇති අතර බඳවා ගැනීම සඳහා සැපිරිය යුතු ඉතිරි කටයුතු ඉදිරියේ දී සිදු කිරීමට නියමිතය. නමුත් ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව බඳවා ගැනීම තාවකාලිව අත්හිටුවා ඇත. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළයුතු වීම |
| (ඇ) | යහපත් කම්කරු සබඳතාවයක් පවත්වා ගනිමින් සමාජ ආර්ථික සංවර්ධනයට දායකවන ඵලදායී ශ්‍රම බලකායක් ඇති කිරීම වෙනුවෙන් ප්‍රධාන විෂය පථ 03 ක් ඔස්සේ ආයතනය පුහුණු හා අධ්‍යාපන ක්‍රියාකාරකම් සිදුකරනු ලැබේ. නමුත් පසුගිය වසර 05 තුල පවත්වා තිබූ පුහුණු වැඩසටහන් විශ්ලේෂණයේදී බොහෝදුරට ඒකාකාරී ස්වභාවයක පුහුණු වැඩසටහන් සැලැස්මක් පිළියෙල කර තිබූ අතර නව්‍යතාවයක් හෝ විවිධාංගීකරණය කිරීමක් විගණනයේදී නිරීක්ෂණය නොවුණි. එනම්, නව පාඨමාලා ඇතුලත් කිරීම, පාඨමාලා අපේක්ෂකයන්ගේ අවශ්‍යතාවන්ට අනුකූලව සංශෝධනය වීම හා නව | අප ආයතනය හැකි සෑම විටම පුහුණු වැඩසටහන් නව්‍යතාවයක් හා විවිධාංගීකරණයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.<br>පුහුණුලාභීන් බලාපොරොත්තු වනුයේ වඩාත් වෘත්තීය මට්ටමකින් යුතු හා ඔවුන්ගේ සේවා අවශ්‍යතාවයන්ට ඉදිරි වෘත්තීමය අවස්ථාවන්ට අනුකූලව පාඨමාලාවන් පවත්වන්නේ ද නැත්ද යන්න හා ඒ සඳහා පළපුරුදු හා විෂය කරුණු පිළිබඳ මනා පරිචයකින් හා දැනුමකින් සන්නද්ධ සම්පත්දායකින් හා දේශක මහතුන් විසින් එම වැඩසටහන් හා පුහුණු පාඨමාලාවන් පවත්වන්නේ ද යන්නයි. එවන් ප්‍රතිලාභ නොලැබෙනම් ඔවුන් අප ආයතනය විසින් පවත්වන | ආයතනයේ අරමුණු ළඟාකර ගැනීමට ඵලදායී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළයුතු වීම |

| | | | |
|---|---|---|---|
| | ආකාරයකින් පුහුණු වැඩසටහන් පැවැත්වීම කෙරෙහි පුහුණු අංශයේ අවධානය යොමු වී නොතිබුණි. | පාඨමාලාවන් හා වැඩසටහන් හා වැඩමුළු සඳහා සහභාගී නොවේ.<br>අප ආයතනය උක්ත ක්‍රියාමාර්ගයන් වෙත යොමු වීමට දැඩිව ක්‍රියා කරන අතරම පවත්නා අභියෝග මධ්‍යයේ අප ආයතන විසින් පාඨමාලාවන් හා වැඩසටහන්වල නව්‍යභාවයක් ඇති කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග 8 ක් පමණ දැනටමත් ගෙන ඇත. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අංශයේ සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතනයන්හි ඉල්ලීම පරිදි කාර්යමණ්ඩල බඳවා ගැනීමේ, කාර්යක්ෂමතා කඩඉම් සහ ඇගයීම් හා සේවා උසස් කිරීම සඳහා වූ විභාග ආයතනික අවශ්‍යතා මත විභාග අංශය විසින් පවත්වනු ලැබේ. නමුත් අදාල විෂයන් අනුව ප්‍රශ්නපත්‍ර සැකසීම, පිළිතුරු පත්‍ර ඇගයීම මණ්ඩලයක් විසින් නොව එකම පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන අතර වෙනත් පුද්ගලයෙකු විසින් අධීක්ෂණය කිරීමක් සිදුනොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේම 2021 වර්ෂය තුල කම්කරු අමාත්‍යාංශයට සම්බන්ධ ආයතන දෙකක විභාග 6 ක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය පවත්වා තිබූ අතර විභාග පැවැත්වීමේ ස්වාධීනත්වය පිළිබඳ ගැටලු මතුවිය හැකිව පැවතුණි. | විභාග අංශයට අදාලව සම්පත්දායකය සංචිතය තෝරා ගැනීම, ගෙවීම් කටයුතු විධිමත් කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වා දෙමින් 2021 පෙබරවාරි 02 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේ දී පත්‍රිකා 02ක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලදි. ඒ හරහා විභාග අංශයේ කටයුතු වඩා විධිමත් කිරීම සහ බාහිර ආයතනයන්ට ගුණාත්මක සේවාවක් සැපයීම අරමුණු කර ගන්නා ලදි.<br>විභාග විෂමතාවයක් ඇති වීම වළක්වා ගැනීම, පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා කළ හැකි සෑම ක්‍රියාමාර්ගයන්ම ගැනීමේ අවශ්‍යතාවය අප ආයතනය විසින් හඳුනාගෙන ඇති අතර තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම කළයුතු ක්‍රියාකාරකමකි. මේ සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ අවධානය යොමු කර ඇති අතර එහිදී ගනු ලබන තීරණ මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. එසේ වුවද අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) තනතුර සඳහා සුදුසු අයකු තවමත් බඳවා ගත නොහැකි වුව ද මේ වන තෙක් පවත්වන ලද විභාග සම්බන්ධ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු නිරන්තර අධීක්ෂණය හා නිරීක්ෂණය යටතේ සිදු කරන ලදී.<br>ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු අමාත්‍යාංශය යටතේ පැවතියත් එය ස්වාධීන ආයතනයකි. ඒ අනුව කම්කරු අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල විභාග පැවැත්වීම අප | පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද භාවිතා කරමින් විභාග නීතිරීති අනුව විධිමත්ව විභාග පැවැත්වීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | ආයතනය විසින් සිදු කරන නමුත් එම විභාගවල රහස්‍යභාවය රැක ගැනීම සඳහා පියවර ගෙන ඇති අතර විභාග පැවැත්වීම උපරිම විශ්වාසය හා රහස්‍යභාවය සුරකින අයුරින් ඉටු කරන බැවින් මෙතෙක් පවත්වන ලද විභාගවල කිසිදු ගැටළුවක් පැන නැඟී නොමැති අතර වෘත්තීමය අයුරින් පවත්වා ඇති බවද දන්වා සිටිමි. | |
| (ආ) 2020 ජූලි මාසයේදී පර්යේෂණ, ප්‍රකාශන හා ව්‍යාපෘති අංශයක් ස්ථාපිත කර එම අංශය සඳහා වැඩබලන සහකාර අධ්‍යක්ෂවරයෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. 2022 අප්‍රේල් 10 දිනටත් වෙනත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර හෝ බඳවාගෙන නොතිබුණි. ඒ අනුව මෙම අංශය පිහිටුවීමේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීම ඉතා මන්දගාමී තත්වයක පැවතුණි. | වර්තමානය වන විට ආයතනය සතුව පවතින සීමිත මානව හා මූල්‍ය සම්පත් සැකිල්ලට ගෙන පවතින මානව සම්පතින් උපරිම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමින් පවති. එබැවින්, ආයතනය මූල්‍යමය වශයෙන් ස්ථාවර වීම හා මානව සම්පත වැඩි කර ගැනීම අතර කාලීන වශයෙන් සමබරතාවයක් පවත්වා ගනිමින් කටයුතු කරනු ලබයි. තවදුරටත්, පර්යේෂණ, ප්‍රකාශන හා ව්‍යාපෘති අංශ සඳහා අවශ්‍ය බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම සඳහා 47 වන පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 362 පාලක පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අනුව, මෙම වසංගත තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පත්වූ විට හා ආයතනයේ මූල්‍ය තත්ත්වය ස්ථාවරත්වට පත්වූ විට එම තනතුරු සඳහා සුදුසුකම් ලත් නිළධාරීන් ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගත යුතුය. |